// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1805/28 – 2013 අප්‍රේල් 10 වැනි බදාදා – 2013.04.10

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය : පීටීබී/එල්එන්ඩී/ඒසීකිව්යූඅයි/7/23.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිටබැද්දර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද පිඹුරු අංක 6 හා අතිරේක 17 පත්‍ර අංක 18 හා 2013.03.11 දිනැති අවසාන ගම් පිඹුරේ පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0051 ක් පමණ වන කැබලි අංක 400 වන මුරුක්කන් දොලහේන නමැති ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 400**

ඉඩමේ නම: මුරුක්කන් දොලහේන ; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්. එච්. ලලිත් මහින්දසිරි චන්දන, ගොරකවෙල, පිටබැද්දර ; ප්‍රමාණය : හෙක්. 0.0051.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජුනි මස 10 වැනි දින පූ. භා. 10.00 ට පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 ජුනි මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. ජී. ආර්. ජයනාත්,
ප්‍රාදේශීය ලේකම්,
පිටබැද්දර.

2013 අප්‍රේල් මස 03 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 791

1A – G 17553 – 350 (2013/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*